# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 11,662—1959 පෙබරවාරි 7 වැනි සෙනසුරාදා—7.2.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඬ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## මිල පාලන දැන්වීම්

බීඩී/46 වැනි අංකය දරණ ආහාර මිළ නියෝගය. | අතිරේක ආහාර ද්‍රව්‍ය (උම්බලකඩ).

### 1950 අංක 29 දරණ මිළ පාලන පනත

### නියෝගය

බදුලු දිස්ත්‍රික්කයේ සහකාර ආහාර මිළ පාලක තැන්පත් තුවන් ඉසකීන් කාසිම් වන මම, 1950හේ අංක 29 දරණ මිළ පාලන පනතේ අංක 3 (2) දරණ වගන්තිය සමග කියවිය යුතු අංක 4 දරණ වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල අනුව—

(1) 1958 අගෝස්තු 27 වැනි දින අංක 11,505 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පලකරන ලද 1958 අගෝස්තු 22 වැනි දින බීඩී/41 දරණ ආහාර මිළ නියෝගයේ උප ලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් උම්බලකඩ පිළිබඳව එම උපලේඛනයේ 3 සහ 4 වැනි තීරයන්හි පිළිවෙලින් සඳහන් තොග වෙළෙන්දෙකුගේ වැඩිම තොග වෙළඳ මිළද, සිල්ලර වෙළෙන්දෙකුගේ වැඩිම සිල්ලර වෙළඳ මිළද මෙම නියෝගයෙන් අද සිට අවලංගු කරමි.

(2) තොග වෙළෙන්දෙකු තොග වශයෙන් විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර හොණ්ඩරයක්ද. සිල්ලර වෙළෙන්දකු සිල්ලර වශයෙන් පාරිභෝගිකයෙකුට විකිණීමේදී උම්බලකඩ ශුද්ධ බර රාත්තලක්ද, උපලේඛනයේ දක්වන ලද සීමාවන් ඇතුළත විකිණිය හැකි වැඩිම මිළ මේ උප ලේඛනයේ 3 හා 4 වැනි තීරවල අනුපිළිවෙලින් සඳහන්කර තිබෙන මිළ ගණන් බව මෙම නියෝගයෙන් නියම කරමි.

(3) තවද මෙම නියෝගයේ කාය්‍ය්‍ය සඳහා—

(අ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් නැවත විකිණීම සඳහා විකිණීම තොග වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,
(ආ) උම්බලකඩ ඕනෑම ප්‍රමාණයක් පරිභෝගය හෝ පාවිච්චිය පිණිස විකිණීම සිල්ලර වශයෙන් විකිණීමක් ලෙස සලකන බවත්,
(ඇ) තොග වශයෙන් විකුණන ශුද්ධ බර හොණ්ඩරයකට අඩු හෝ වැඩි ඕනෑම උම්බලකඩ ප්‍රමාණයකට ගෙවිය යුතු වැඩිම මුදල ගණන් ගනු ලබන්නේ මෙහි සඳහන් ශුද්ධ බර හොණ්ඩරයක් තොග වශයෙන් විකිණීමේ වැඩිම මිල අනුව බවත් මෙම නියෝගයෙන් නියම කරමි.

(4) එසේම උපලේඛනයේ සඳහන් සීමාවන් තුළ උම්බලකඩ වෙන ද්‍රව්‍යයක් සමග මිශ්‍ර කිරීමෙන් බාල කොට කිසිවෙකු විසින් නොවිකිණිය යුතු බව නියම කරමි.

(5) තවද, උපලේඛනයේ සඳහන් සීමාවන් තුළ යම් ස්ථානයක හෝ වාහනයක උපලේඛනයේ 2 වැනි තීරයේ සඳහන් උම්බලකඩ සිය ස්වාමිත්වය හෝ පාලනය යටතේ තබාගෙන සිටින සෑම වෙළෙන්දෙකුට මෙම නියෝගයෙන් නියමිත වැඩිම මිළ ගණන් සටහන් කරන ලද දැන්වීමක් එකී ස්ථානයේ හෝ වාහනයේ ප්‍රකටව පෙනෙන පරිදි තැබිය යුතුබව නියම කරමි.

(6) එසේම, මෙම නියෝගයේ කාර්ය සඳහා '' රාත්තල '' හෙවත් '' රා '' යන්නෙන් සලකනු ලබන්නේ ඇවර්දූපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර බවද නියම කරමි.

(7) එසේම, උපලේඛනයේ සඳහන් සීමාවන් තුළ උම්බලකඩ තොග වශයෙන් විකුණන සෑම තැනැත්තකු හා සිල්ලර වශයෙන් විකුණන සෑම තැනැත්තකුම මිළයට ගන්නා ඉල්ලුවහොත් පහත සඳහන් විස්තර, එනම්—

(අ) විකුණූ දිනය ;
(ආ) විකුණූ උම්බලකඩ ප්‍රමාණය බර,
(ඇ) විකුණූ ප්‍රමාණය සඳහා ගෙවූ මුදල,
(ඈ) වෙළඳාමේ ස්වභාවය, එනම්, තොග වශයෙන්ද, සිල්ලර වශයෙන්ද යන වග, ඇතුළත් කුවිතාන්සියක් දියයුතු බවද නියම කරමි.

(8) උම්බලකඩ විකුණන විට එය ඔතා හෝ බහා දෙන යම්කිසි දෙයක් වෙතොත් එහි මිළත් උපලේඛනයේ 3 වැනි සහ 4 වැනි තීරවල සඳහන් මිළගණන් වලට ඇතුළත්වී ඇති බවද නියම කරමි.

1959 පෙබරවාරි මස 2 දින ප. ව. 3.30ට බදුලු කච්චේරියේ දීය.

ටී. අයි. කාසිම්,
බදුලු දිස්ත්‍රික්කයේ (ආහාර) සහකාර මිළ පාලක තැන.

415—ජේ. ඇන්.ආර් 234—4,050 (2/59)

## උපලේඛනය

| 1 වැනි තීරය | 2 වැනි තීරය | 3 වැනි තීරය | | 4 වැනි තීරය | |
|---|---|---|---|---|---|
| සීමාවන් | විස්තර | තොග වෙළෙන්දෙකු විසින් දළබර හොණ්ඩර යක් තොග වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | | සිල්ලර වෙළෙන්දෙකු විසින් ශුද්ධ බර රාත්තලක් සිල්ලර වශයෙන් විකිණිය හැකි වැඩිම මිළ | |
| | | රු. | ශ. | රු. | ශ. |
| බදුල්ල නගර සභාව, බෝගොඩ ගම් කායර්‍ය සහා සීමාව තුල පිහිටි හාලිඇල වවුම, බල්ලාකැටුව සහ දෙමෝදර වවුම, කුඹල්වෙල ගම් කායර්‍ය සහා සීමාව තුළ සිහිටි නමුණුකුල වවුම | උම්බලකඩ (සියළුම වර්ගවල) | 254 | 0 ... | 2 | 52 |
| පස්සර සුලු නගර සභාව, හාලි ඇල වවුම හැර බෝගොඩ ගම් කායර්‍ය සහා සීමාව, ඇල්ල වවුම හැර කුඹල්වෙල ගම් කායර්‍ය සහා සීමාව, බල්ලාකැටුව, දෙමෝදර සහ නමුණුකුල වවුම, රිල්පල සහ සොරණාතොට ගම් කායර්‍ය සහා සීමාවන් | උම්බලකඩ (සියළුම වර්ගවල) | 254 | 0 ... | 2 | 54 |
| ලුනුගල සුලු නගර සභා සීමාව, පස්සර ගම් කායර්‍ය සභා සීමාව ... | උම්බලකඩ (සියළුම වර්ගවල) | 257 | 0 ... | 2 | 57 |
| බින්තැන්න, කඳුකර, ඔයපලාත, වියලුව, පට්ටිපොල සහ වැගම්පත්තු නිල්ගල ගම් කායර්‍ය සහා සීමාවන් | උම්බලකඩ (සියළුම වර්ගවල) | 259 | 0 ... | 2 | 59 |
| පැල්වත්ත, අරලුපිටිය, බුත්තල, මැදගම්පත්තු, මුප්පනේ පිහිටි මොණරාගල වවුම හැර බුත්තල වැදිරට, දඹගල්ල, නිකවැරටිය මහ වැදිරට ගම් කායර්‍ය සහා සීමාවන්, | උම්බලකඩ (සියළුම වර්ගවල) | 262 | 0 ... | 2 | 64 |
| හපුතලේ නගර සභා සීමාව ... ... ... | උම්බලකඩ (සියළුම වර්ගවල) | 254 | 0 ... | 2 | 54 |
| බණ්ඩාරවෙල නගර සභා සීමාව, දියතලාවේ ග්‍රාමීය කොට්ඨාශය, හල්දුම්මුල්ල වවුම | උම්බලකඩ (සියළුම වර්ගවල) | 254 | 0 ... | 2 | 54 |
| කොස්ලන්ද නගර සභා සීමාව ... ... ... | උම්බලකඩ (සියළුම වර්ගවල) | 257 | 0 ... | 2 | 54 |
| බණ්ඩාරවෙල, හපුතලේ සහ දියතලාව හැර මහපලාත ගම් කායර්‍ය සහා සීමාව, වැලිමඩ සුලුනගර සභාව, වැල්ලවාය වවුම සහ කන්දපල්ල නො. 1 ගම් කායර්‍ය සහා සීමාව | උම්බලකඩ (සියළුම වර්ගවල) | 257 | 0 ... | 2 | 57 |
| දඹවිනි පලාත, දෙහිවිනි පලාත, මැද පලාත, උඩ පලාත, යටි පලාත සහ ගම්පහ ගම් කායර්‍ය සහා සීමාවන් | උම්බලකඩ (සියළුම වර්ගවල) | 259 | 0 ... | 2 | 59 |
| බුත්තල වැදිරට ගම් කායර්‍ය සහා සීමාව තුල පිහිටි මුප්පනේ, මොණරාගල කඩමණ්ඩිය, කන්දපල්ල නො. 2 ගම් කායර්‍ය සහා සීමාව, සිත්තරම් පලාත, කෝන්ගල බින්තැන්න, වැල්ලවාය වවුම හැර වැල්ලවාය ගම් කායර්‍ය සහා සීමාව | උම්බලකඩ (සියළුම වර්ගවල) | 257 | 0 ... | 2 | 59 |

**සැලකිය යුතුයි.**—මේ මිළ ගණන් ඉහත සඳහන් ද්‍රව්‍යය විකිණීමේ නියමිත මිළ නොවේ. මේවා ඒ ද්‍රව්‍ය විකිණිය හැකි ඉතාම වැඩි මිළ ගණන් ය. මේ මිළ ගණන් වලට ඉහලින් ඒ ද්‍රව්‍යයන් විකිණිය නො හැකිය.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරණ ලදී